(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක. 2.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2020 අගෝස්තු 21 සිකුරාදා පූ. භා. 9.30 ට**

## ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

**යෝජනා පිළිබඳ දැනුම්දීම**

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී 27 දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— තේරීම් කාරක සභාව (අංක 1),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 114හි විධිවිධාන ප්‍රකාරව, නවවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ සේවය කිරීම සඳහා තේරීම් කාරක සභාව, කථානායකවරයාගේ සභාපතිත්වයෙන් සහ දේශපාලන පක්ෂවල නායකයන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ද ඇතුළත්ව පාර්ලිමේන්තුව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් දොළොස් දෙනෙකුගෙන් (12) සමන්විත විය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— තේරීම් කාරක සභාව (අංක 2),— අද දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, මතු සඳහන් සාමාජික මන්ත්‍රීවරයන් දොළොස් දෙනා (12) නවවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ තේරීම් කාරක සභාවේ සේවය කළ යුතුය:—

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු ඩලස් අලහප්පෙරුම මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු රවුෆ් හකීම් මහතා

ගරු විජිත හේරත් මහතා

ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා

4.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, 2020 අගෝස්තු 27 බ්‍රහස්පතින්දා සහ 28 සිකුරාදා රැස්වීම් පැවැත්වෙන දිනයන් විය යුතු ය.

5.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණද, 2020 අගෝස්තු 27 බ්‍රහස්පතින්දා සහ 28 සිකුරාදා රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 9.30 සිට අ.භා. 6.30 දක්වා විය යුතු ය. අ.භා. 6.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

6.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 3),— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2020 අගෝස්තු 27 බ්‍රහස්පතින්දා පූ. භා. 9.30. වන තෙක් කල් තැබිය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

1.

ගරු නිපුණ රණවක මහතා,— ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 32(4) සහ 33(2)(අ) ව්‍යවස්ථා ප්‍රකාරව අතිගරු ජනාධිපතිතුමා විසින් 2020 අගෝස්තු 20 දින ඉදිරිපත් කරන ලද ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය විවාද කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

---